# ගුරුතුමීට තෑග්ගක්



ආදර්ශ්නා ගජේන්ද්‍රා

# පුරුතුමිට තෑග්ගක්

**ආදර්ශනා ගජේන්ද්‍රා**

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදයි පුරවැසියෙකු සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැලපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදයක් මෙන්ම ගත් කතුවරයකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ" දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන්, ශිෂ්‍යාවන්, සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන්, ගුරු භවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමඟින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවයද අගයමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023.10.20

# පිදුම

මට මේ කතන්දර පොත ලියන්නට අවස්ථාව ලබා දී මාව
ගත්කතුවරියක් බවට පත් කරන්නට
මා උනන්දු කරවූ ගුරුමෑණිවරුන්ට, පියවරුන්ට,
මාගේ දෙමව්පියන්ට සහ පවුලේ සැමට මගේ
පොත ආදරයෙන් පිළිගන්වමි

දවසක් මම උදෙන්ම ඉස්කෝලේ ගියා.
පුදුමයක්! අපේ පන්තියේ අමුත්තෙක්.
මේ කවුද?

හැමෝම කලබලෙන්!



අපේ අලුත් ගුරුතුමිය එයා කියලා
අමුත්තා කිවුවා. අපි හැමෝටම හරිම සතුටුයි.
ගුරුතුමී හරිම ලස්සනයි.
හැමවෙලාවෙම ඉන්නේ හිනාවෙලා.
ලස්සන ඔසරියක් ඇඳලා ලොකු
කොණ්ඩයක් බැඳලා හරියට අම්මා
කෙනෙක් වගේ.



අපේ ගුරුතුමී හරිම හොඳයි කරුණාවන්තයි. අපට හරිම ආදරෙයි. නිතරම අපි ගැන හොයලා බැලුවා. ඒ වගේම ටිකක් සැරයි. ඒ ඉතින් අපිව හොඳට හදන්නනේ. ඒ නිසා අපි ආදරෙයි.



කාලය ගෙවිලා ගියා. අපි දැන් එක පවුලක් වගේ. සතුටින් ඉගෙන ගත්තා. දවසක් ගුරුතුමී අපිව විනෝද චාරිකාවකුත් එක්කරගෙන ගියා.



සිංදු කියලා, නටලා ගුරුතුමීත් අපිත් එක්ක විනෝද වුණේ හරියට පොඩි ළමයෙක් වගේ. ඒ ගමන මට නම් කවදාවත් අමතක වෙන්නේ නෑ.



අපේ ගුරුතුමීට හොඳට නටන්න,ගයන්න පුළුවන්. අපේ වසර අවසාන විවිධ ප්‍රසංගයට එතුමිය අපට ලස්සන නැටුමක් පුරුදු කළා. ඒක බලපු හැමෝම පුදුමයටත් සතුටටත් පත්වුණා. ගුරුතුමීගේ ඇස්වල කඳුළු පිරිලා තියෙනවා මම දැක්කා. ඒ සතුටට වෙන්න ඇති.





අපි ගුරුතුමීත් එක්ක හිටපු කාලය ඉක්මනින්
ගෙවිලා ගිහින්. මට නම් දුකයි.
යාළුවන්ටත් දුකයි. ගුරුතුමියගෙන්
ඉගෙන ගත් කාලය ඉවරයිලු.



ඒ ඇයි?
අම්මා කිව්වේ ඒ රාජකාරිවල හැටි කියලා.



මම එතුමියට දෙන්න තෑග්ගක් ගැන කල්පනා කළා. මට ආදරයෙන් උගන්වපු ගුරුතුමීට පොතක් තෑගි කරන්න මට හිතුණා. ඔව් ඒක තමයි හොඳම තෑග්ග. ඉතින් මම පොතක් ලිව්වා.

මේ තමයි ඒ පොත.
මේ පොත මගේ ගුරුතුමියට
උපහාරයක් වේවා.!

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත් කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදයක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම් කරුවන් ට මෙන්ම සමාජයේ වගකිව යුතු පාර්ශ්වයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

“දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත් කතු අංකුර ඔබට ලෝකය දිනන ගත් කතු වරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතිය නිර්මාතෘ
2023.10.20



**ආදර්ශ්නා ගජේන්ද්‍රා**

978-624-206-592-2